SRI LANKA

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

2020 විෂය නිර්දේශය

**නියාමක ප්‍රශ්න පත්‍රය**

# අදියර II

# 201 - උසස් මූල්‍ය ගිණුම්කරණය සහ පිරිවැයකරණය (AFC)

අධ්‍යාපන සහ පුහුණුකිරීම් අංශයේ ප්‍රකාශනයකි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය
# 201 - උසස් මූල්‍ය ගිණුම්කරණය සහ පිරිවැයකරණය (AFC)
# නියාමක ප්‍රශ්න පත්‍රය

**අයදුම්කරුවන්ට උපදෙස් (කරුණාකර අවධානයෙන් කියවන්න) :**

**දෙනු ලබන කාලය:**

- කියවීම සඳහා : විනාඩි 15 යි.
- ලිවීම සඳහා : පැය 03 යි.

**ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය:**

- A කොටස, B කොටස සහ C කොටස ලෙස කොටස් 3 කින් මෙම ප්‍රශ්න පත්‍රය සමන්විතය.
- සියළුම ප්‍රශ්නවලට උත්තර ලිවිය යුතුය.

**ලකුණු:**

- එක් එක් කොටස සඳහා ලකුණු :

| **කොටස** | **ලකුණු** |
|---|---|
| A | 25 |
| B | 50 |
| C | 25 |
| **එකතුව** | **100** |

- එක් එක් ප්‍රශ්නය සඳහා ලකුණු පෙන්වා ඇත.
- මෙම ප්‍රශ්න පත්‍රය සඳහා සමත්වීමේ ලකුණු 50% කි.

**උත්තර:**

- සියළුම උත්තර,සපයනු ලබන උත්තර පොත්වල ලිවිය යුතුය. ප්‍රශ්නපත්‍රවල ලියනු ලබන උත්තර ලකුණු දීම් සඳහා ඇගයීමට ලක් නොකරනු ඇත.
- එක් එක් ප්‍රශ්නය සඳහා ඔබේ උත්තරය අළුත් පිටුවකින් ආරම්භ කරන්න.
- සියලුම පෙර වැඩ පැහැදිලිව පෙන්නුම් කළ යුතුය.
- තීරුවල උත්තර නොලිවිය යුතුය.

**උත්තර පොත්:**

- එක් එක් උත්තර පොතේ මුල් පිටුවේ උපදෙස් පෙන්වා ඇත.

**ගණකයන්ත්‍ර:**

- සංකේත වීජගණිතමය හා අවකලනය සඳහා පහසුකම් සලසා ඇති ඒවා හැර ඕනෑම ගණක යන්ත්‍රයක් අයදුම්කරුවන්ට භාවිත කිරීමට අවකාශය ඇත. වැඩසටහන් කළ හැකි ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු නොලැබේ.

**ඇමුණුම්:-**

- කළයුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව. එක් එක් ප්‍රශ්නය (වාස්තවික පරීක්ෂා ප්‍රශ්න හැර) කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළයුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ දී ඇති නිර්වචනය මත පදනම්ව අයදුම්කරුවන් විසින් උත්තර සැපයිය යුතුය.

**වාස්තවික පරීක්ෂා ප්‍රශ්න (OTQs)**
**අනිවාර්ය ප්‍රශ්න 12 කි.**

(මුළු ලකුණු 25)

**A කොටස**

*01 වන ප්‍රශ්නය*

**අංක 1.1 සිට 1.5 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම නිවැරදි උත්තරය තෝරන්න.තෝරාගත් උත්තරයට අදාල අංකය,ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.**

**1.1** මූල්‍ය ප්‍රකාශනවල අඩංගු මූලිකාංග මැනීමට භාවිතා කළ නොහැකි වන්නේ පහත සඳහන් ඒවායින් කුමක්ද?

(1) උපලබ්ධි අගය. (2) ධාරණ අගය.

(3) වර්තමාන අගය. (4) ඓතිහාසික අගය. **(ලකුණු 02)**

**1.2** **සීමාසහිත Dotcom (පෞද්ගලික) සමාගම** විසින් 2020 මාර්තු 31 න් අවසන් වර්ෂය තුළදී ආදායම් බදු වශයෙන් රු.151,000/-ක් ගෙවන ලදි. 2019 මාර්තු 31න් සහ 2020 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා ආදායම් බදු වෙන්කිරීම පිළිවෙලින් රු.37,000/- ක් සහ රු.43,000/- කි. පසුගිය වර්ෂයන් සඳහා අධි හෝ ඌන ආදායම් බදු වෙන්කිරීම් නොමැති නම් 2020 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා ආදායම් බදු වියදම් වනුයේ:

(1) රු. 194,000/- කි. (2) රු.43,000/- කි. (3) රු.71,000/- කි. (4) රු.157,000/- කි.

**(ලකුණු 02)**

**1.3** **Fast pack සමාගම** වීදුරු බෝතල් නිෂ්පාදනයේ යෙදී සිටින අතර පහත සඳහන් තොරතුරු වීදුරු බොතල් නිෂ්පාදනයට භාවිතා කරන ද්‍රව්‍යයට අදාල වේ:

- වාර්ෂික ඉල්ලුම 30,625
- එක් අයිතමයක් තබා ගැනීමේ පිරිවැය - රු.2.00
- ඇනවුමක ඇනවුම් පිරිවැය රු.1.00

ආර්ථික ඇනවුම් ප්‍රමාණය (EOQ) වනුයේ:

(1) ඒකක 600. (2) ඒකක 248. (3) ඒකක 175. (4) ඒකක 425.

**(ලකුණු 02)**

**1.4** මූල්‍ය ප්‍රකාශන තුල නොගැලපිය යුතු සිදුවීමක් සඳහා උදාහරණයක් වන්නේ පහත සඳහන් ඒවායින් කුමක්ද ?

(1) වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසානයේ ප්‍රකාශයට පත්කල ලාභාංශ.

(2) සමාගම විසින් සිදුකරනු ලැබූ විෂමාචාරයක් සම්බන්ධයෙන් වාර්තාකරණ කාලපරිච්ඡේදයෙන් පසුව අධිකරණය විසින් නියම කරන ලද දඩ මුදලක්

(3) වාර්තාකරණ කාලපරිච්ඡේදයෙන් පසුව කර්මාන්තශාලා ගොඩනැගිල්ලට සිදුවූ සැලකිය යුතු ප්‍රමාණයේ හානියක් .

(4) වාර්තාකරණ කාලපරිච්ඡේදයෙන් පසු ගංවතුර හේතුවෙන් වෙළඳ තොගයට සිදුවූ සැලකිය යුතු හානියක්.

**(ලකුණු 02)**

**1.5** සංකලිත ගිණුම්කරණ පද්ධතියක වාසියක් **නොවන්නේ** පහත සඳහන් ඒවායින් කුමක්ද ?

(1) ද්විකරණ දෝශ ඇති නොවීම.

(2) ලිපිකරු පිරිවැය අවම වීම.

(3) පිරිවැය ගිණුම් හා මූල්‍ය ගිණුම් අතර ලාභ සංසන්දනය අවශ්‍ය වීම.

(4) ගිණුම්කරණ කටයුතු වඩාත් ඵලදායී ලෙස පාලනය කළ හැකි වීම. **(ලකුණු 02)**

**අංක 1.6 සිට 1.12 දක්වා ඇති ප්‍රශ්න සඳහා උත්තර ඔබේ උත්තර පොතේ දී ඇති අංකය සමග ලියා දක්වන්න.**

**1.6** පිරිවැය ගිණුම්කරණය හා මූල්‍ය ගිණුම්කරණය අතර ඇති වෙනස්කම් දෙකක් (02) සඳහන් කරන්න. **(ලකුණු 02)**

**1.7** ද්‍රව්‍ය පාලනයේ අරමුණු දෙකක් (02) සඳහන් කරන්න. **(ලකුණු 02)**

**1.8** කාලය පදනම් කරගත් ගෙවීම් ක්‍රමයක ඇති අවාසි දෙකක් (02) ලැයිස්තුගත කරන්න. **(ලකුණු 02)**

**1.9** 1890 හවුල් ව්‍යාපාර ආඥාපනතට අනුව පහත සඳහන් එක් එක් සිදුවීම සම්බන්ධයෙන් ඇති විධානයක් සඳහන් කරන්නඃ

(a) ව්‍යාපාරය සඳහා නව හවුල්කරුවෙකු බඳවා ගැනීම.

(b) ව්‍යාපාරයේ ස්වභාවය වෙනස් කිරීම. **(ලකුණු 02)**

**1.10** JIT පද්ධතියක වාසි දෙකක් (02) සඳහන් කරන්න **(ලකුණු 02)**

**1.11** **A, B** සහ **C** ලාභ'ලාභ පිළිවෙලින් 5 ඃ 3 ඃ 2 අනුපාතයට බෙදා ගනිමින් පවත්වාගෙන යන **ABC හවුල් ව්‍යාපාරයේ** හවුල්කරුවන් වේ. 2019 දෙසැම්බර් 31 දින **C** හවුල් ව්‍යාපාරයෙන් ඉවත්වීමට තීරණය කළ අතර **A** සහ **B** ලාභ'ලාභ පිළිවෙලින් 3 ඃ 2 අනුපාතයට බෙදා ගනිමින් හවුල් ව්‍යාපාරය පවත්වාගෙන යාමට එකඟ විය.

2019 දෙසැම්බර් 31 දින පහත සඳහන් වත්කම් ප්‍රත්‍යගණනය කරන ලදී.

| | **2019 දෙසැම්බර් 31 දිනට ධාරණ අගය (රු.)** | **2019 දෙසැම්බර් 31 දිනට ප්‍රත්‍යගණන වටිනාකම (රු.)** |
|---|---|---|
| ඉඩම හා ගොඩනැගිල්ල | 24,000 | 30,000 |
| මෝටර් වාහන | 2,400 | 2,000 |

වත්කම් සියල්ල ප්‍රත්‍යගණන වටිනාකම් මත ගිණුම් පොත්වල පවත්වා ගැනිමට තීරණය විය.

වත්කම් ප්‍රත්‍යගණනයට අදාල ජර්නල් සටහන් පිළියෙල කරන්න. **(ලකුණු 02)**

**1.12** නිෂ්පාදන සමාගමක් වන XYZ සමාගම සංකලිත නොවන ගිණුම්කරණ පද්ධතියක් පවත්වාගෙන යයි. 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ගිණුම්වල රු.632,325/- ක ලාභයක් පෙන්නුම් කලද පිරිවැය ගිණුම් අනුව ලාභය වෙනස් අගයක් විය. මෙම වෙනස සඳහා පහත සඳහන් හේතූන් අනාවරණය විය:

(1) තොග ආගණනය:

| | **පිරිවැය ගිණුම් අනුව (රු.)** | **මූල්‍ය ගිණුම් අනුව (රු.)** |
|---|---|---|
| ආරම්භක තොගය | 423,000 | 375,000 |
| අවසාන තොගය | 685,000 | 725,000 |

(2) අධ්‍යක්ෂක ගාස්තු ලෙස ගෙවූ රු.250,000/- මූල්‍ය ගිණුම්වල පමණක් සඳහන්ව ඇත.

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිරිවැය ගිණුම් අනුවලාභය **ගණනය කරන්න.** **(ලකුණු 03)**

**(මුළු ලකුණු 25)**

## *A කොටසේ අවසානය*

**අනිවාර්ය ප්‍රශ්න පහ(05) කි**
(මුළු ලකුණු 50)

## B කොටස

### *02 වන ප්‍රශ්නය*

(A) **JAVA සමාගම** භාණ්ඩ වෙළදාමේ නිරත සමාගමක් වන අතර එක් අයිතමයකට අදාලව 2019 දෙසැම්බර් මාසය තුළ සිදුකරනු ලැබූ ගණුදෙනු පහත පරිදි වේ.

| **දිනය** | **විස්තරය** | **ප්‍රමාණය (ඒකක)** | **ඒකකයක මිල (රු.000)** |
|---|---|---|---|
| 01/12/2019 | ආරම්භක තොගය | 100 | 20 |
| 03/12/2019 | මිලට ගැණුම් | 250 | 30 |
| 05/12/2019 | මිලට ගැණුම් | 200 | 32 |
| 10/12/2019 | නිකුත් කිරීම් | 150 | - |
| 15/12/2019 | නිකුත් කිරීම් | 200 | - |
| 21/12/2019 | මිලට ගැණුම් | 300 | 28 |
| 25/12/2019 | මිලට ගැණුම් | 250 | 24 |
| 30/12/2019 | නිකුත් කිරීම් | 450 | - |

සමාගම, බර තැබූ සාමාන්‍ය පිරිවැය ක්‍රමය (WAC) යටතේ තොග ලොජරය පිළියෙළ කරනු ලැබේ.

**ඔබ විසින් කළයුතු දෑ:**

**පහත දෑ ගණනය කරන්න:**

**(a)** අවසන් තොගයේ වටිනාකම. **(ලකුණු 03)**

**(b)** විකුණුම් පිරිවැය. **(ලකුණු 02)**

**(B)** **තරුෂි ගඩොල් සැකසුම් සමාගමේ** ගඩොල් සැකසුම් අංශයේ නියුතු සේවක සංඛ්‍යාව හතරක් (04) වන අතර පහත තොරතුරු සමාගමේ 2019 අගෝසතු මාසයට අදාල වේ:

| **නම** | **ශ්‍රම අනුපාතය** | **මාසය තුළ වැඩකළ පැය ගණන** |
|---|---|---|
| නිමල් | පැයකට රු.16 බැගින් | 160 |
| නන්දසේන | පැයකට රු.10 බැගින් | 80 |
| උමරසිංහ | පැයකට රු.08 බැගින් | 196 |
| අමල්(වැඩ අධීක්ෂක) | මසකට රු.3,200 බැගින් | 160 |

පහත සඳහන් අතිරේක තොරතුරුද සපයා ඇත:

(1) මාසයකට අදාල සාමාන්‍ය වැඩ කරන කාලය පැය 160 කි. අතිකාල ගණනය කරනු ලබන්නේ පැයක වැටුප් අනුපාතයෙන් 150% කි.

(2) සේවක අර්ථසාධක අරමුල සේවා යෝජකයා සහ සේවා දායකයගේ දායකත්වය මූලික වැටුපෙන් පිළිවෙලින් 15% ක් හා 10% කි.සේවක භාර අරමුදලට දායකත්වය මූලික වැටුපෙන් 3% කි.

(3) සියළුම සේවකයින් සඳහා මසකට රු.4,000/- ක ජීවන වියදම් දීමනාවන් ගෙවනු ලබන අතර අධීක්ෂක ගේ ප්‍රවාහන දීමනාව වසරකට රු.120,000/- කි.

(4) සේවක සුභසාධක සංගමයේ වාර්ෂික සාමාජික ගාස්තුව එක් සාමාජිකයෙකු ට රු.6000/- කි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2019 අගෝස්තු මාසය සඳහා වැටුප් ලේඛනය **පිළියෙල කරන්න.** **(ලකුණු 05)**

**(මුළු ලකුණු 10)**

## *03 වන ප්‍රශ්නය*

**මියුරු සමාගම** බිස්කට් නිෂ්පාදනය කරනු ලබන සමාගමකි. සමාගම සතුව නිෂ්පාදන දෙපාර්තුමේන්තු දෙකක් (සැකසුම්,ඇසුරුම්) සහ එක් සේවා (ගබඩා) දෙපාර්තමේන්තුවත් වේ.

පහත සඳහන් ඇස්තමේන්තුගත තොරතුරු ලබන වසර සඳහා අදාල වේ.

- ගොඩනැගිලි රක්ෂණ රු.1,250,000/-
- යන්ත්‍ර ක්ෂය රු.960,000/-
- ගොඩනැගිලි ක්ෂය රු.1,080,000/-

| **විස්තරය** | **සැකසුම** | **ඇසුරුම්** | **ගබඩා** | **එකතුව** |
|---|---|---|---|---|
| වක්‍ර ද්‍රව්‍ය (රු.) | 500,000 | 350,000 | - | 850,000 |
| වක්‍ර ශ්‍රමය (රු.) | 450,000 | 250,000 | 170,000 | 870,000 |
| යන්ත්‍ර වටිනාකම (රු.) | 8,000,000 | 4,000,000 | - | 12,000,000 |
| ගොඩනැගිලි වටිනාකම (රු.) | 25,000,000 | 15,000,000 | 10,000,000 | 50,000,000 |
| ද්‍රව්‍ය අධියාචනා පත්‍ර සංඛ්‍යාව | 2,000 | 1,000 | - | 3,000 |
| යන්ත්‍ර පැය | 63,300 | 17,500 | - | 80,800 |

පොදුකාර්යය වියදම් යන්ත්‍ර පැය මත පදනම්ව නිෂ්පාදන දෙපාර්තමේන්තු සඳහා අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

**ඔබ විසින් කළයුතු දෑ:**

**(a)** එක් එක් නිෂ්පාදන දෙපාර්තමේන්තුවට පොදු කාර්යය වියදම් විභජනය කර බෙදාහරින ආකාරය දැක්වෙන ප්‍රකාශනයක් **පිළියෙල කරන්න.** **(ලකුණු 08)**

**(b)** සැකසුම් දෙපාර්තමේන්තුවේ එක් ඒකකයකට නිෂ්පාදන පොදුකාර්යය අන්තර්ග්‍රහණ අනුපාතය **ගණනය කරන්න.** **(ලකුණු 02)**

**(මුළු ලකුණු 10)**

## *04 වන ප්‍රශ්නය*

**ගංගා, නදී** සහ **යමුනා** 2005 දී පිහිටුවන ලද හවුල් ව්‍යාපාරයේ හවුල්කරුවන්ය. හවුල් ගිවිසුමේ පහත සඳහන් කොන්දේසි ඇතුලත් වේ:

- **ගංගා, නදී** සහ **යමුනා** පිළිවෙලින් 3:2:1 අනුපාතයට ලාභ'ලාභ බෙදා ගනී.
- ප්‍රාග්ධන ගිණුම්වල ආර්ම්භක ශේෂ මත 10% ක වාර්ෂික පොලියක් ලැබීමට හවුල්කරුවන්ට හිමිකමක් ඇත.
- **ගංගා** සහ **නදීට** පිළිවෙලින් රු.10,000/- ක් සහ රු.15,000 ක මාසික වැටුපකට හිමිකමක් ඇත.

පහත සඳහන් ශේෂ පිරික්සුම 2019 මාර්තු 31 දිනට ව්‍යාපාරයේ පොත්වලින් උපුටා ගන්නා ලදී. (රු.000)

| | හර | බැර |
|---|---|---|
| දේපල, පිරියත සහ උපකරණ - පිරිවැයට | 3,700 | |
| සමුච්චිත ක්ෂය | | 420 |
| විකුණුම් පිරිවැය | 2,985 | |
| 2018 අප්‍රේල් 01 දිනට ප්‍රාග්ධන ගිණුම් ශේෂයන් | | |
| **- ගංගා** | | 1,500 |
| **- නදී** | | 1,000 |
| **- යමුනා** | | 500 |
| 2018 අප්‍රේල් 01 දිනට ජංගම ගිණුම් ශේෂයන් | | |
| **- ගංගා** | | 300 |
| **- නදී** | 100 | |
| **- යමුනා** | | 285 |
| විකුණුම් | | 6,800 |
| පරිපාලන වියදම් | 470 | |
| බෙදා හැරීමේ වියදම් | 1,800 | |
| මූල්‍ය වියදම් | 225 | |
| ගැනිලි **- ගංගා** | 120 | |
| **- නදී** | 125 | |
| **- යමුනා** | 60 | |
| අතැති සහ බැංකු මුදල් | 1,220 | |
| | **10,805** | **10,805** |

2019 මාර්තු 31 දින හවුල් ව්‍යාපාරයෙන් විශ්‍රාම යාමට යමුනා තීරණය කරන ලදී. එදිනට හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය රු.1,800,000/- ක් ලෙස ගණනය කරන ලද අතර එය කීර්තිනාම ගිණුමක් විවෘත නොකර හවුල් කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් තුළින් ගැලපීමට තීරණය විය.

ලාභ'ලාභ සමසමව බෙදා ගනිමින් හවුල් ව්‍යාපාරය ඉදිරියට පවත්වාගෙන යාමට ගංගා සහ නදී තීරණය කරන ලදී. යමුනාගේ විශ්‍රාම ගැනීමෙන් පසු ඇයට ගෙවියයුතු මුදල ණය ගිණුමකට මාරු කිරීමට තීරණය කළේය.

**ඔබ විසින් කළයුතු දෑ:**

**2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත දෑ පිළියෙල කරන්න:**

(a) හවුල් ව්‍යාපාරය අදාල ලාභ'ලාභ විසර්ජන ගිණුම **(ලකුණු 03)**

(b) ප්‍රාග්ධන ගිණුම් **(ලකුණු 03)**

(c) ජංගම ගිණුම් **(ලකුණු 04)**

**(මුළු ලකුණු 10)**

## *05 වන ප්‍රශ්නය*

**Spicy ක්‍රීඩා සමාජය** 2000 වර්ෂයේදී ආරම්භ කරන ලදී. 2019 ජනවාරි 01 දිනට එහි සාමාජික සංඛ්‍යාව 50 ක් වූ අතර වර්ෂික සාමාජික ගාස්තුව රු.20,000/- කි.

(1) පහත සඳහන් තොරතුරු වර්ෂය තුළදී ලද සාමාජික ගාස්තු සම්බන්ධයෙනි.

- සමාජිකයින් 10 දෙනෙකු 2018 වර්ෂය සඳහා සමාජික මුදල් ගෙවන ලදී.
- සාමාජිකයින් 45 දෙනෙකු ප්‍රවර්ධන වර්ෂය සඳහා සාමාජික මුදල් ගෙවන ලදී.
- සාමාජිකයින් 05 දෙනෙකු ඊළඟ වසර සඳහා සාමාජික ගාස්තු ගෙවා ඇත.

(2) 2019 ජනවාරි 01 වන දිනට සාමාජිකයින් 15 දෙනෙකු 2018 වර්ෂය සඳහා සාමාජික ගාස්තුව ගෙවා නොමැති අතර සාමාජිකයන් 05 දෙනෙකු 2019 වර්ෂය සඳහා ඔවුන්ගේ සාමාජික මුදල ගෙවා ඇත.

(3) වෙනත් වත්කම් හා වගකීම් පහත පරිදි වේ. රු.'000

| | **2019 ජනවාරි 01 දිනට** | **2019 දෙසැම්බර් 31 දිනට** |
|---|---|---|
| ක්‍රීඩා උපකරණවල ධාරන අගය | 8,500 | 9,000 |
| ඉඩම හා ගොඩනැගිලි | 2,400 | 2,000 |
| උපචිත විදුලිය | 400 | 200 |

(4) පහත සදහන් ගෙවීම් වර්ෂය තුළදී සිදුකරන ලදී:

| | රු.'000 |
|---|---|
| ක්‍රීඩා උපකරණ | 1,800 |
| විදුලිය | 600 |
| මුද්‍රන සහ ලිපි ද්‍රව්‍ය | 200 |
| ක්‍රීඩාංගන නඩත්තු වියදම් | 150 |
| වැටුප් | 750 |
| ප්‍රචාරණ | 100 |

(5) වර්ෂය තුළදී ලද පරිත්‍යාග රු.2,750,000/- කි.

(6) 2019 ජනවාරි 01 දිනට මුදල් ශේෂය රු.175,000/- කි.

**ඔබ විසින් කළයුතු දෑ:**

**2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත දෑ පිළියෙල කරන්න:**

(a) සාමාජික දායක මුදල් ගිණුම **(ලකුණු 03)**

(b) ලැබීම් සහ ගෙවීම් ගිණුම **(ලකුණු 03)**

(c) ආදායම් සහ වියදම් ගිණුම **(ලකුණු 04)**

**(මුළු ලකුණු 10)**

## *06 වන ප්‍රශ්නය*

**මාරියෝ** විසින් 2019 ඔක්තෝබර් 01 වන දින රු.1,000,000/- ක මුදලක් ආයෝජනය කරමින් කේවලස්වාමි ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. ඔහු විසින් නිසි පරිදි ගිණුම් පොත් පවත්වා නොගනී.

(1) 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ කාලපරිච්ජේදය සහ ඔහුගේ ව්‍යාපාරයේ බැංකු ප්‍රකාශවලින් පහත තොරතුරු උපුටා ගන්නා ලදී:

| | | රු. |
|---|---|---|
| ලැබීම් | ආයෝජන | 1,000,000 |
| | විකුණුම් | 2,400,000 |
| | ණය මුදල | 750,000 |
| ගෙවීම් | සැපයුම්කරුවන් සඳහා | 1,200,000 |
| | කුලිය (මසකට රු 25,000 බැගින්) | 300,000 |
| | විදුලිය සහ දුරකථන ගාස්තු | 190,000 |
| | වැටුප් | 650,000 |
| | 2019 නොවැම්බර් 30 දින මෝටර් රථයක් මිලට ගැනීම. | 1,200,000 |

(2) සියළුම විකුණුම් අත්පිට මුදලට වන අතර 2019 ඔක්තෝබර් මාසයේ සිට සෑම මසකම ව්‍යාපාරයේ විකුණුම් මුදල් බැංකු ගත කිරීමට පෙර රු.10,000/- බැගින් ලබා ගන්නා ලදි.

(3) 2019 දෙසැම්බර් 31 දිනට වෙළඳ ගෙවිය යුතු මුදල් සහ උපචිත විදුලිය පිළිවෙලින් රු.275,000/-ක් සහ රු.7500/-ක් විය.

(4) 2019 දෙසැම්බර් 31 දිනට තොගයේ වටිනාකම රු425,000 කි.

(5) මෝටර් රථ සරල මාර්ග ක්‍රමය යටතේ වර්ෂයකට 20 % බැගින් ක්ෂය කරනු ලැබේ.

(6) 2019 දෙසැම්බර් 01 දින වාර්ෂික පොලිය 12% බැගින් වූ රු.750,000/- ක බැංකු ණයක් ලබා ගන්නා ලද අතර එහි පළමු වාරිකය 2020 ජනවාරි 01 දින ගෙවන ලදී.

(7) බැංකු ගාස්තු රු 4,500/-ගිණුම් පොත්වල සටහන් කර නොමැත.

**ඔබ විසින් කළයුතු දෑ:**

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාලපරිච්ජේදය සඳහා **මාරියෝගේ ව්‍යාපාරය** සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශනය **පිළියෙල කරන්න.** ***(ලකුණු 10)***

***B කොටසේ අවසානය***

**අනිවාර්ය ප්‍රශ්න එක (01) කි**

(මුළු ලකුණු 25)

**C කොටස**

### *07 වන ප්‍රශ්නය*

**සීමාසහිත SITJ (පෞද්ගලික) සමාගම**, ජංගම දුරකතන සහ පරිගනක විකිනීමේ ව්‍යාපාරයක නිරත වේ.

2019 මාර්තු 31 දිනට සමාගමේ ශේෂ පිරික්සුම පහත පරිදි වේ:

(රු.'000)

| | හර | බැර |
|---|---|---|
| දේපල,පිරියත සහ උපකරණ පිරිවැයට | 22,000 | |
| 2018 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය | | 6,500 |
| 2018 අප්‍රේල් 01 වන දිනට තොග: | | |
| පරිගණක | 3,500 | |
| ජංගම දුරකථන | 1,200 | |
| විකුණුම්: | | |
| පරිගණක විකුණුම් | | 25,375 |
| ජංගම දුරකථන විකුණුම් | | 15,000 |
| මිලට ගැණුම්: | | |
| පරිගණක | 8,500 | |
| ජංගම දුරකථන | 6,000 | |
| වෙනත් ආදායම් | | 2,000 |
| බොල් ණය | 160 | |
| 2018 අප්‍රේල් 01 වන දිනට අඩමාන ණය සඳහා වෙන්කිරීම | | 560 |
| වෙළඳ ගෙවිය යුතු මුදල් | | 5,000 |
| වෙළඳ ලැබිය යුතු මුදල් | 12,000 | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය (සමාන්‍ය කොටස් 1,000,000) | | 15,000 |
| 2018 අප්‍රේල් 01 වන දිනට රඳවාගත් ඉපැයීම් | | 5,000 |
| විදුලිය | 250 | |
| කුළී ගෙවීම් | 500 | |
| ආදායම් බදු ගෙවීම් | 100 | |
| වැටුප් හා වේතන | 1,800 | |
| විකුණුම් කොමිස් | 450 | |
| ප්‍රචාරණය | 375 | |
| දුරකතන වියදම් | 250 | |
| 2019 මාර්තු 01 වන දින ලබාගත් 12% බැංකු ණය | | 4,000 |
| අතැති මුදල් සහ බැංකු ණය | 21,350 | |
| | **78,435** | **78,435** |

පහත සඳහන් අතිරේක තොරතුරුද සපයා ඇත:

(1) 2019 මාර්තු 31 දිනට තොගයේ පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය පහත පරිදි වේ:

| | **පිරිවැය (රු.)** | **ශුද්ධ උපලබ්ධි අගය (රු.)** |
|---|---|---|
| පරිගණක | 2,000,000 | 2,500,000 |
| දුරකතන | 500,000 | 300,000 |

(2) 2018 අප්‍රේල් 01 දිනට දේපළ පිරියත සහ උපකරණවලට අදාල තොරතුරු පහත පරිදි වේ:

(රු.'000)

| | **පිරිවැය** | **සමුච්චිත ක්ෂය** | **ධාරන අගය** |
|---|---|---|---|
| ඉඩම | 9,000 | - | 9,000 |
| ගොඩනැගිල්ල | 6,000 | 4,000 | 2,000 |
| මෝටර් රථ | 6,000 | 2,000 | 4,000 |
| කාර්යාල උපකරණ | 1,000 | 500 | 500 |
| | **22,000** | **6,500** | **15,500** |

- ඉඩම් හැර සියළුම දේපල පිරියත හා උපකරණ වාර්ෂිකව 10% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලැබේ.
- 2019 ජනවාරි 01 වන දින,සමාගම විසින් මෝටර් රථයක් රු.2,800,000/- කට විකුණන ලදී. මෙම මෝටර් රථය 2014 දෙසැම්බර් 31 දිනට රු.3,500,000/- කට මිලට ගත් අතර විකිණීමෙන් ලද මුදල්, මුදල් ගිණුමට හර කොට පරිගණක විකුණුම් ගිණුමට බැර කොට ඇත. මේ සම්බන්ධයෙන් වෙනත් කිසිඳු සටහනක් පොත්වල තබා නොමැත.

(3) සියළුම විකුණනු ලබන පරිගණක සහ දුරකතන සඳහා වගකීම් සහතිකයෙන් ලබා දෙනු ලබන අතර විකුණුම් මිලෙන් 5% ක පිරිවැයක් දරනු ලබන බව ඇස්තමේන්තු ගත කර තිබේ.

(4) සමාගමේ ප්‍රතිපත්තිය වනුයේ වර්ෂ අවසානයේ පැවැති ණයගැති ශේෂය මත 5% ක අඩමාන ණය වෙන්කිරීමක් පවත්වා ගැනීම වේ.

(5) 2019 මාර්තු සඳහා වන රු.45,000/-ක විදුලි බිල ගෙවා නොමැත.

(6) සමාගම 2018 අප්‍රේල් 01 වන දින කුළී ගිවිසුමකට එළඹ අති අතර මාසික කුලිය රු.50,000 කි.

(7) 2018/19 තක්සේරු වර්ෂය සඳහා ආදායම් බද්ද රු.250,000ක් ලෙස ඇස්තමේන්තු කොට ඇත.

(8) 2019 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා සාමාන්‍ය කොටසකට රු.2/50 බැගින් වූ ලාභාංශයක් ගෙවීමට සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් 2019 අප්‍රේල් 15 වන දින තීරණය කරන ලදී.

(9) වර්ෂය තුළදී සමාගම රු.1,000,000/- ක් පොදු සංචිතයට මාරු කළ අතර මේ සම්බන්ධයෙන් කිසිඳු සටහනක් තබා නොමැත.

(10) 2019 මැයි 18 දින මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබා දී ඇත.

**ඔබ විසින් කළයුතු දෑ:**

**(a)** 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශනය **පිළියෙල කරන්න.** **(ලකුණු** 12)

**(b)** 2019 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. **(ලකුණු** 13)

**(මුළු ලකුණු** 25)

**C කොටස අවසානය**

# කළයුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| | | | |
|---|---|---|---|
| **විශ්ලේෂණය (4)** | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම | විශ්ලේෂණය කරන්න | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න |
| | | වෙනස් කොට දක්වන්න | යමක් තවෙකකින් වෙනස්කොට දක්වන දෑ හඳුනා ගැනීම |
| | | විමසන්න | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම |
| | | සමානකම් බලන්න | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම |
| | | අසමානතා බලන්න | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම |
| | | සැකිල්ලක් සේ දක්වන්න | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම |
| | | සන්නිවේදනය කරන්න | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම |
| **භාවිතය (3)** | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිතකර ගැළපීම | භාවිත කරන්න | ප්‍රායෝගිකව භාවිතයේ යෙදෙන්න |
| | | ගණනය කරන්න | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම |
| | | ප්‍රදර්ශනය කරන්න | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම |
| | | පිළියෙළ කරන්න | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම |
| | | විසඳන්න | ගණනය කිරීම හා හෝ පැහැදිලි කිරීම හරහා විසඳුම් සෙවීම |
| | | තක්සේරු කරන්න | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මකබව තීරණය කරන්න |
| | | ප්‍රස්ථාර දක්වන්න | ප්‍රස්ථාර මගින් නියෝජනය කරන්න |
| | | සසඳන්න | තවත් එකක් සමග අනුගත/අනුරූප කරන්න |
| **අවබෝධය (2)** | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම | නිර්වචනය කරන්න | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම |
| | | පැහැදිලි කරන්න | අදාල කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම |
| | | විස්තර කරන්න | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න |
| | | අර්ථකථනය කරන්න | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න |
| | | හඳුනා ගන්න | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම |
| **දැනුම (1)** | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | ලැයිස්තුගත කරන්න | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම |
| | | හඳුනා දක්වන්න | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම |
| | | සඳහන් කරන්න | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම |
| | | සම්බන්ධ කරන්න | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම |
| | | අඳින්න | හැඩයක් හෝ රූප සටහනක් ගෙනහැර දැක්වීම |
| **නිපුණතා මට්ටම** | **විස්තරය** | **ක්‍රියා ලැයිස්තුව** | **ක්‍රියා නිර්වචනය** |

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

2020 විෂය නිර්දේශය

## ආදර්ශ විසඳුම්

# අදියර II

# 201 - උසස් මූල්‍ය ගිණුම්කරණය සහ පිරිවැයකරණය (AFC)

අධ්‍යාපන සහ පුහුණුකිරීම් අංශයේ ප්‍රකාශනයකි.

**වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)**
**අනිවාර්ය ප්‍රශ්න දොළහකි (12) කි**
(මුළු ලකුණු 25)

**A කොටස**

*01 වන ප්‍රශ්නය සඳහා යෝජිත පිළිතුර*

**1.1** (2) **1.2** (4) **1.3** (3) **1.4** (1) **1.5** (3)

**1.6**

| | **මූල්‍ය ගණුම්කරණය** | **පිරිවැය ගිණුම්කරනය** |
|---|---|---|
| කාල රාමුව | ගණුදෙනු සටහන් කිරීම සහ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම නිශ්චිත කාල රාමුවකට අනුව සිදුවේ. | පිරිවැය ඒකකයක් සමඟ ගණුදෙනු හඳුනා ගනී. |
| ගණුදෙනු ආවරණය | මුළු ව්‍යාපාරයේම ගණුදෙනු ආවරණය කෙරේ. | ගණුදෙනුවලින් කොටසක් පමණක් ආවරණය කෙරේ. |
| අරමුණ | ව්‍යාපාරයේ මෙහෙයුම් ප්‍රතිඵල සහ මූල්‍ය තත්වය ඉදිරිපත් කිරීමට යොදාගනී. | කළමනාකරණයට අවශ්‍ය සැලසුම් කිරීම,පාලනය හා තීරණ ගැනීම උපකාරී කර ගැනීම අරමුණ වේ |
| වියදම් විශ්ලේෂණය | කාර්යයන් අනුව වියදම් විශ්ලේෂණය කෙරේ. | විවිධ වූ පදනම් මත වියදම් විශ්ලේෂණය කෙරේ. |
| කාර්යක්ෂමතාව | මූල්‍ය ප්‍රකාශන මඟින් ව්‍යාපාරයේ සම්පූර්ණ මෙහෙයුම් ප්‍රතිඵල සහ මූල්‍ය තත්වය හෙළිදරව් කරනු ලැබේ. | එක් අංශයේ එක් එක් පිරිවැය ඒකකය කාර්යය හෝ ක්‍රියාවලීන්හි ලාභදායීත්වය විශ්ලේෂණය කෙරේ. |
| ද්‍රව්‍ය පාලනය | ද්‍රව්‍ය පරිහරණයට අදාල කාර්යක්ෂමතා/ අකාර්යක්ෂමතා පිළිබඳව අවධානය යොමු නොකරයි. | තොග මිලට ගැනීම් ගබඩා කිරීම් සහ නිකුත්කිරීම්වලට අදාල තොග පාලනය පිළිබඳව ක්‍රියා පිළිවෙත් හඳුන්වා දේ. |
| පද්ධතිවල ස්වාධීනත්වය | පිරිවැය ගිණුම්කරණයෙන් ස්වාධීන වේ. | මූල්‍ය ගිණුම්කරණය මත රඳා පවතී. |
| ප්‍රතිඵල සංසන්දනය | සංසන්දනය කිරීම අවශ්‍ය නොවේ. | ලාභය, මූල්‍ය වාර්තා සමඟ සංසන්දනය කිරීම අවශ්‍ය වේ. |
| නාස්තිය | මේ පිලිබඳ සැලකිලිමත් නොමැත. | නාස්තිවීම් හා අලාභ සාමාන්‍ය සහ අසාමාන්‍ය ලෙස වර්ග කෙරේ |
| ගණුදෙනු | සත්‍ය තොරතුරු හා සංඛ්‍යා මත පමණක් පදනම් වේ. | සත්‍ය සහ ඇස්තමේන්තුගත තොරතුරු හා සංඛ්‍යා මත පදනම් වේ. |
| තොග අගය කිරීම | තොග අගය කරනු ලබන්නේ පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකින් අඩු අගයටය. | තොග පිරිවැය මත අගය කෙරේ. |
| නීතිමය අවශ්‍යතා | විවිධ වූ නීති පද්ධතීන්ට අනුකූල විය යුතුය. | කළමණාකරණයේ අවශ්‍යතාවට අනුකූල වන පරිදි තොරතුරු පවත්වා ගනී. |

**(ඕනෑම වෙනස්කම් දෙකකට ලකුණු 02)**

**1.7**

(1) නියමිත ප්‍රමිතියෙන් යුත් ද්‍රව්‍ය නියමිත වේලාවට නියමිත ප්‍රමාණයෙන් සැපයීම තහවුරු කිරීම.

(2) සැපයුම් කරුවෙකු තෝරා ගැනීමේදී මිල,ගුණත්වය සහ බෙදා හැරීම අතර තුලනයක් පවත්වා ගැනීම.

(3) තොග සඳහා අනවශ්‍ය පරිදි ප්‍රාග්ධන ආයෝජනය නොකිරීමට වගබලා ගැනීම. (අධික ලෙස තොග ගබඩා කිරීමෙන් වැලකීම.)

(4) තොග අසාමාන්‍ය ලෙස නාස්තිවීම් ,කාන්දු වීම් ආදිය වලක්වා ගැනීම.

(5) ද්‍රව්‍ය යල් පැනීම වලක්වා ගැනීම.

(6) ද්‍රව්‍ය සම්බන්ධයෙන් කළමනාකරුට තොරතුරු සැපයීම.

(7) ද්‍රව්‍ය නිසි පරිදි ගබඩා කිරීම සහ පාලනය සහතික කිරීම.

(8) තොග ආගණනය පහසු වීම.

(9) තොග මට්ටම් නිසිලෙස භෞතිකව පරීක්ෂා කිරීම. **(ඕනෑම කරුණු 02 කට ලකුණු 02)**

**1.8**

(1) වැඩි නිමැවුමක් සිදුකරන කාර්යක්ෂම සේවකයන්ට දිරිගැන්වීමක් නොවීම.

(2) එකම ශ්‍රේණියේ සේවකයන්ට කාර්යයසාධනය නොසලකා එකම අනුපාතයකින් ගෙවීම් සිදුකිරීම.

(3) සමීප අධීක්ෂණය අනිවාර්ය වන බැවින් අධීක්ෂණ පිරිවැය ඉහළ වීම.

(4) කාර්යක්ෂම හා අකාර්යක්ෂම කම්කරුවන්ට එකම වැටුපක් හිමිවේ, එනම් උත්සාහයට ලැබෙන ප්‍රතිලාභ අතර නොගැලපීමක් ඇත.

(5) වැටුප්වල සමානාත්මතාව නිසා කාර්යක්ෂම සේවකයින් අධෛර්යට පත්වීම.

(6) ඒකකයට ශ්‍රම පිරිවැය තක්සේරු කිරීම අපහසු වීම.

(7) අතිකාල කිරීමේ අරමුණින් සේවකයන් සෙමෙන් වැඩ කිරීමට පෙළඹවීම.

(8) ගුණාත්මක භාවයට වඩා ප්‍රමාණය වැදගත් වන බව නිෂ්පාදන සඳහා මෙම ක්‍රමය යොග්‍ය නොවේ.

**(ඕනෑම කරුණු 02 කට ලකුණු 02)**

**1.9** (a) සියළුම හවුල් කරුවන්ගෙන් කැමැත්ත ලබා ගත යුතු වීම. **(ලකුණු 01)**

(b) ඒකමතිකව තීරණයක් ගතයුතු වීම. **(ලකුණු 01)**

**1.10**

(1) බිඳ වැටීම් ශුන්‍ය වීම.

(2) 100% ක් නියමිත වේලාවට සැපයීම.

(3) වටිනාකම් එකතු නොවන ක්‍රියාකාරකම් ඉවත් කිරීම.

(4) දෝශ ශුන්‍ය වීම.

(5) තොග සඳහා අඩු ආයෝජනයක් අවශ්‍ය වීම.

(6) ඉඩ කඩ ඉතිරි වීම.

(7) උසස් තත්වය සහ ඉහළ බෙදාහැරීම්වල ප්‍රතිඵලයන් ලෙස පාරිභෝගික තෘප්තිය ඉහළ යෑම.

**(ඕනෑම කරුණු 02 කට ලකුණු 02)**

**1.11**

| | | |
|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි හර | 6,000 | |
| මෝටර් රථ බැර | | 400 |
| ප්‍රාග්ධන ගිණුම් A බැර | | 2,800 |
| B බැර | | 1,680 |
| C බැර | | 1,120 |
| වත්කම් ප්‍රත්‍යාගණනය ගිණුම් ගත කිරිම | | |

**(ලකුණු 02)**

**1.12**

| | |
|---|---|
| මූල්‍ය ගිණුම් අනුව ලාභය | 632,325 |
| එකතු කළා - අධ්‍යක්ෂ ගාස්තු | 250,000 |
| | 882,325 |
| අඩුකලා- ආරම්භක තොගය | (48,000) |
| - අවසාන තොගය | (40,000) |
| පිරිවැය ගිණුම් අනුව ලාභය | 794,325 |

**(ලකුණු 03)**

**(මුළු ලකුණු 25)**

***A කොටසේ අවසානය***

## *02* වන ප්‍රශ්නය සඳහා යෝජිත පිළිතුරු

| | |
|---|---|
| **ඒකක 5** | **- පිරිවැය ගිණුම්කරණය.** |
| **ඉගෙනුම් ප්‍රතිඵල** | - ද්‍රව්‍ය පාලනය සඳහා වූ ක්‍රියාපටිපාටි පැහැදිලි කිරීම හා තොග සම්බන්ධ වූ පිරිවැය ගණනය කිරීම<br>- ශ්‍රමය සඳහා භාවිතා කරන ක්‍රියාපටිපාටි හඳුනා දැක්වීම හා ශ්‍රම පිරිවැය ගණනය කිරීම |

**(A)**

රු.'000

| දිනය | ලැබීම් | | | නිකුත්කිරීම් | | | ශේෂය | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය | ඒකකයක මිල (රු.) | වටිනාකම (රු.) | ප්‍රමාණය | ඒකකයක මිල (රු.) | වටිනාකම (රු.) | ප්‍රමාණය | ඒකකයක මිල (රු.) | වටිනාකම (රු.) |
| 01/12 | | | | | | | 100 | 20 | 2,000 |
| 03/12 | 250 | 30 | 7,500 | | | | 350 | 27 | 9,500 |
| 05/12 | 200 | 32 | 6,400 | | | | 550 | 28.9 | 15,900 |
| 10/12 | | | | 150 | 28.9 | 4,335 | 400 | 28.9 | 11,565 |
| 15/12 | | | | 200 | 28.9 | 5,780 | 200 | 28.9 | 5,785 |
| 21/12 | 300 | 28 | 8,400 | | | | 500 | 28.37 | 14,185 |
| 25/12 | 250 | 24 | 6,000 | | | | 750 | 26.9 | 20,185 |
| 30/12 | | | | 450 | 26.9 | 12,105 | 300 | 26.9 | 8,080 |

(a) රු.8,080,000/- **(ලකුණු 03)**

(b) රු.22,220,000/- **(ලකුණු 02)**

**(B)**

| නම | මූලික වැටුප | එකතුකිරීම් | | | දළ වැටුප | අඩු කිරීම | | ශුද්ධ වැටුප | සේ.අ.අ (15%) | සේ.භා.අ (3%) |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ජීවන වියදම් දීමනාව | ප්‍රවාහන දීමනාව | අතිකාල දීමනාව | | සාමාජික ගාස්තු | සේ.අ.අ 10% | | | |
| නිමල් | 2,560 | 4,000 | | | 6,560 | 500 | 256 | 5,804 | 384 | 76.8 |
| නන්දසේන | 800 | 4,000 | | | 4,800 | 500 | 80 | 4,220 | 120 | 24 |
| අමරසිංහ | 1,280 | 4,000 | | 432 | 5,712 | 500 | 128 | 5,084 | 192 | 38.4 |
| අමල් | 3,200 | 4,000 | 10,000 | - | 17,200 | 500 | 320 | 16,380 | 480 | 96 |
| **එකතුව** | 7,840 | 16,000 | 10,000 | 432 | 34,272 | 2,000 | 784 | 31,488 | 1,176 | 235.2 |

**(ලකුණු 05)**

**(මුළු ලකුණු 10)**

## *03 වන ප්‍රශ්නය සඳහා පිළිතුර*

| | |
|---|---|
| **ඒකක 5** | **- පිරිවැය ගිණුම්කරණය.** |
| **ඉගෙනුම් ප්‍රතිඵල** | - පොදු කාර්ය පිරිවැය බෙදා හැරීම/විභජනය තක්සේරු කිරීම. |

**(a)**

**පොදු කාර්ය විශ්ලේෂණ පත්‍රිකාව** (රු.)

| පිරිවැය අයිතම | බෙදා හැරීමේ පදනම | මුළු පොදු කාර්යය පිරිවැය | නිෂ්පාදන දෙපාර්තමේන්තු | | සේවා දෙපාර්තමේන්තුව |
|---|---|---|---|---|---|
| | | | සැකසුම් | ඇසුරුම් | |
| වක්‍ර ද්‍රව්‍ය | ඍජු පදනම | 850,000 | 500,000 | 350,000 | - |
| වක්‍ර ශ්‍රමය | ඍජු පදනම | 870,000 | 450,000 | 250,000 | 170,000 |
| ගොඩනැගිලි රක්ෂණය | ගොඩනැගිලි පිරිවැය 5.3.2 | 1,250,000 | 625,000 | 375,000 | 250,000 |
| යන්ත්‍ර ක්ෂය | යන්ත්‍ර පිරිවැය 2.1 | 960,000 | 640,000 | 320,000 | - |
| ගොඩනැගිලි ක්ෂය | ගොඩනැගිලි පිරිවැය | 1,080,000 | 540,000 | 324,000 | 216,000 |
| | | | 2,755,000 | 1,619,000 | 636,000 |
| සේවා දෙපාර්තමේන්තුවේ පිරිවැය බෙදා හැරීම | ද්‍රව්‍ය අධියාචනා පත්‍ර සංඛ්‍යාව 2.1 | | 424,000 | 212,000 | (636,000) |
| නිෂ්පාදන දෙපාර්තමේන්තුවලට අදාල මුළු පොදු කාර්යය පිරිවැය | | | 3,179,000 | 1,831,000 | - |

**<u>පෙරවැඩ</u>**

<u>ගොඩනැගිලි රක්ෂණය</u>

සැකසුම් - $1,250,000 \times \frac{5}{10} = 625,000$

ඇසුරුම් - $1,250,000 \times \frac{3}{10} = 375,000$

ගබඩා - $Rs. 1,250,000 \times \frac{2}{10} = Rs. 250,000$

<u>ගොඩනැගිලි ක්ෂය</u>

සැකසුම් - $1,080,000 \times \frac{5}{10} = 540,000$

ඇසුරුම් - $1,080,000 \times \frac{3}{10} = 324,000$

ගබඩා - $1,080,000 \times \frac{2}{10} = 216,000$

<u>යන්ත්‍ර ක්ෂය</u>

සැකසුම් - $960,000 \times \frac{2}{3} = 640,000$

ඇසුරුම් - $960,000 \times \frac{1}{3} = 320,000$

**(b)**

ඒකකයක් සඳහා සැකසුම් දෙපාර්තමේන්තුවේ පොදු කාර්යය අවශෝෂණ අනුපාතය } $\frac{\text{සැකසුම් දෙපාර්තමේන්තුවට අදාල මුළු පොදු කාර්ය පිරිවැය}}{\text{සැකසුම් දෙපාර්තමේන්තුවට අදාල යන්ත්‍ර පිරිවැය}}$

$= \frac{3,179,000}{63,300}$

= <u>රු.50.22</u>

## *04 වන ප්‍රශ්නය සඳහා යෝජිත පිළිතුර*

**ඒකක 3 - හවුල් ව්‍යාපාරයක් සඳහා වූ මූල්‍ය ප්‍රකාශන.**

**ඉගෙනුම් ප්‍රතිඵල** - හවුල් ව්‍යාපාරයක් සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම.

**ලාභා'ලාභ විසර්ජණ ගිණුම** (රු.000)

| | | |
|---|---|---|
| ශුද්ධ ලාභය (පෙර වැඩ) | | 1,320 |
| ප්‍රාග්ධන පොළී | | |
| ගංගා | 150 | |
| නදී | 100 | |
| යමුනා | 50 | (300) |
| වැටුප් | | |
| ගංගා | 120 | |
| නදී | 180 | (300) |
| ලාභ කොටස් | | 720 |
| ගංගා | 360 | |
| නදී | 240 | |
| යමුනා | 120 | (720) |
| | | - |

**පෙර වැඩ**

**ආදායම් ප්‍රකාශනය**

| | | |
|---|---|---|
| විකුණුම් | | 6,800 |
| විකුණුම් පිරිවැය | | (2,985) |
| දළ ලාභය | | 3,815 |
| බෙදා හැරීමේ වියදම් | (1,800) | |
| පරිපාලන වියදම් | (470) | |
| මූල්‍ය වියදම් | (225) | (2,495) |
| ශුද්ධ ලාභය | | 1,320 |

**(ලකුණු 03)**

**(b)** **ප්‍රාග්ධන ගිණුම්** (රු.'000)

| | **ගංගා** | **නදී** | **යමුනා** | | **ගංගා** | **නදී** | **යමුනා** |
|---|---|---|---|---|---|---|---|
| කීර්ති නාමය | 900 | 900 | - | ඉ.ගේ.ශේෂය | 1,500 | 1,000 | 500 |
| ණය | | | 1,195 | කීර්ති නාමය | 900 | 600 | 300 |
| | | | | ජංගම ගිණුම් | | | 395 |
| ප.ගේ.ශේෂය | 1,500 | 700 | | | | | |
| | **2,400** | **1,600** | **1,195** | | **2,400** | **1,600** | **1,195** |

**(ලකුණු 03)**

**(c)**

**ජංගම ගිණුම්** (රු.'000)

| | **ගංගා** | **නදී** | **යමුනා** | | **ගංගා** | **නදී** | **යමුනා** |
|---|---|---|---|---|---|---|---|
| ඉ.ගෙ.ශේෂය | | 100 | | ඉ.ගේ.ශේෂය | 300 | | 285 |
| ගැනිලි | 120 | 125 | 60 | වැටුප් | 120 | 180 | - |
| ප්‍රාග්ධන ගිණුම | | | 395 | ප්‍රාග්ධන පොළී | 150 | 100 | 50 |
| ප.ගෙ.ශේෂය | 810 | 295 | | ලාභ කොටස් | 360 | 240 | 120 |
| | **930** | **420** | **455** | | **930** | **420** | **455** |

**(ලකුණු 04)**

**(මුළු ලකුණු 10)**

## *05 වන ප්‍රශ්නය සඳහා යෝජිත පිළිතුර*

**ඒකක 4 - අසම්පූර්ණ වාර්තා මඟින් මූල්‍ය ප්‍රකාශන හා ලාභ අරමුණු කර නොගත් සංවිධාන සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම.**

**ඉගෙනුම් ප්‍රතිඵල** - ලාභ අරමුණු කර නොගත් සංවිධානයක මූල්‍ය ප්‍රකාශන කට්ටලයක් පිළියෙල කිරීම

**(a)**

**සාමාජික මුදල් ගිණුම** ( රු.'000)

| | | | |
|---|---|---|---|
| ඉ.ගෙ.ශේෂය | 300 | ඉ.ගෙ.ශේෂය | 100 |
| ආදායම් | 1,000 | මුදල් | 1,200 |
| ප.ගෙ.ශේෂය | 100 | ප.ගේ.ශේෂය | 100 |
| | 1,400 | | 1,400 |

**(ලකුණු 03)**

**(b)**

**Spicy ක්‍රීඩා සමාජය**

**ලැබීම් සහ ගෙවීම් ගිණුම** (රු.'000)

| | **ලැබීම් රු.** | | **ගෙවීම් රු.** |
|---|---|---|---|
| ඉ.ගේ.ශේෂය | 175 | ක්‍රීඩා උපකරණ | 1,800 |
| සාමාජික දායක මුදල් | 1,200 | විදුලිය | 600 |
| පරිත්‍යාග | 2,750 | මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය | 200 |
| | | ක්‍රීඩාංගන නඩත්තු වියදම් | 150 |
| | | වැටුප් | 750 |
| | | ප්‍රචාරණ | 100 |
| | | ප.ගේ. ශේෂය | 525 |
| | **4,125** | | **4,125** |

**(ලකුණු 03)**

**(c)**

**Spicy ක්‍රීඩා සමාජය**
**ආදායම් හා වියදම් ගිණුම** (රු.'000)

| | | |
|---|---|---|
| <u>ආදායම්</u> | | |
| සාමාජික දායක මුදල් | 1,000 | |
| පරිත්‍යාග | 2,750 | 3,750 |
| | | |
| <u>වියදම්</u> | | |
| මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය | 200 | |
| ක්‍රීඩාංගන නඩත්තු වියදම | 150 | |
| වැටුප් | 750 | |
| ප්‍රචාරණ | 100 | |
| ක්ෂය - ක්‍රීඩා උපකරණ | 1,300 | |
| -ගොඩනැගිලි | 400 | |
| විදුලිය (පෙර වැඩ- 01) | 400 | 3,300 |
| වර්ෂය සඳහා අතිරික්තය | | **450** |

**(ලකුණු 04)**

**W – 01** **විදුලිය**

| | | | |
|---|---|---|---|
| | | ඉ.ගේ.ශේෂය | 400 |
| මුදල් | 600 | | |
| | | ආදායම් විසඳුම් ගිණුම | 400 |
| ප.ගේ.ගේ | 200 | | |
| | 800 | | 800 |

**(මුළු ලකුණු 10)**

*06 වන ප්‍රශ්නය සඳහා යෝජිත පිළිතුර*

**ඒකක 4** - **අසම්පූර්ණ වාර්තා මඟින් මූල්‍ය ප්‍රකාශන හා ලාභ අරමුණු කර නොගත් සංවිධාන සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම**

**ඉගෙනුම් ප්‍රතිඵල** - අසම්පූර්ණ වාර්තා මඟින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම.

**මාරියෝ ව්‍යාපාරය**

**2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාලච්ඡේදය සඳහා ආදායම් ප්‍රකාශන (රු000)**

| | | |
|---|---|---|
| විකුණුම් (2400 + 30) | | 2,430 |
| මිලට ගැණුම් (පෙර වැඩ-01) | 1,475 | |
| අවසන් තොගය | (425) | |
| විකුණුම් පිරිවැය | | 1,050 |
| දළ ලාභය | | 1,380 |
| | | |
| බෙදා හැරීමේ වියදම්: | | |
| මෝටර් රථ ක්ෂය (1200× 20% × 1/12) | 20 | (20) |
| | | |
| පරිපාලන වියදම්: | | |
| කුලී වියදම් (25,000 × 3) | 75 | |
| විදුලිය (190+7.5) | 197.5 | |
| වැටුප් | 650 | (922.5) |
| | | |
| <u>මූල්‍ය වියදම්</u> | | |
| බැංකු ගාස්තු | 4.5 | |
| ණය පොළිය (750 × 12% × 1/12 | 7.5 | (12) |
| **ශුද්ධ ලාභය** | | **425.5** |

**පෙර වැඩ -01**

**වෙළඳ ගෙවිය යුතු මුදල්**

| | | | |
|---|---|---|---|
| මුදල් | 1 ,200 | මිලට ගැනුම් | 1,475 |
| ප.ගෙ.ශේෂය | 275 | | |
| | 1,475 | | 1,475 |

**(ලකුණු 10)**

***B කොටසේ අවසානය***

අනිවාර්ය ප්‍රශ්නයකි.

(ලකුණු 25)

**C කොටස**

*07 වන ප්‍රශ්නය සඳහා යෝජිත පිලිතුර*

**ඒකක 1 - මූල්‍ය ප්‍රකාශනවල මූලිකාංග, සංරචක හා මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීම්**

**ඒකක 2 - සීමාසහිත සමාගමක් සඳහා මූල්‍ය ප්‍රකාශන**

**ඉගෙනුම් ප්‍රතිඵල** - ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුව ගිණුම්ගතකරණ ආකාර හා හෙලිදරවු කිරීම් පැහැදිලි කිරීම.
- සීමාසහිත සාමාගමක මූල්‍ය ප්‍රකාශන කට්ටලයක් පිළියෙල කිරීම.

**SITJ (පෞද්ගලික) සමාගම**

**2019 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා**

**විස්තීරණ ආදායම් ප්‍රකාශනය** (රු.'000)

| | | |
|---|---|---|
| විකුණුම් (25,375 +15,000 - 2,800) | | 37,575 |
| (-) විකුණුම් පිරිවැය - පෙර වැඩ 01 | | (16,900) |
| දළ ලාභය | | 20,675 |
| (+) වෙනත් ආදායම් (2000 + 700) පෙරවැඩ-03 | | 2,700 |
| | | 23,375 |
| (-) වියදම් | | |
| බෙදා හැරීමේ වියදම් - පෙරවැඩ -04 | 3,416.25 | |
| පරිපාලන වියදම්- පෙරවැඩ -05 | 3,645 | |
| මූල්‍ය වියදම් | 40 | (7,101.25) |
| බදු පෙර ලාභය | | 16,273.75 |
| (-) අදායම් බදු | | (250) |
| **බදු පසු ලාභය** | | **16,023.75** |

(මුළු ලකුණු 12)

**SITJ (පෞද්ගලික සමාගම)**
**2019 මාර්තු 31 දිනට**
**මූල්‍ය තත්තව ප්‍රකාශනය**

(රු.'000)

| | | |
|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | |
| දේපළ,පිරියත හා උපකරණ-පෙරවැඩ -02 | | 12,187,50 |
| | | |
| **ජංගම වත්කම්** | | |
| තොගය | 2 300 | |
| වෙළඳ ලැබිය යුතු මුදල් | 12 000 | |
| (-) අඩමාණ ණය සඳහා වෙන්කිරීම | (600) | |
| මුදල් සහ මුදල් වලට සමාන දෑ | 21,350 | 35,050 |
| **මුළු වත්කම්** | | **47,237,50** |
| **සකන්ධ සහ වගකීම්** | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය (සාමාන්‍ය කොටස්) | 15,000 | |
| රඳවාගත් ඉපැයීම් (5000 -1000+ 16,023.75) | 20,023.75 | |
| පොදු සංචිතය | 1,000 | 36,023.75 |
| **ජංගම නොවන වත්කම්** | | |
| බැංකු ණය | 4,000 | 4,000 |
| **ජංගම වත්කම්** | | |
| උපචිත විදුලිය | 45 | |
| ගෙවිය යුතු ආදායම් බදු | 150 | |
| වගකීම් සඳහා වෙන්කිරීම (37575 × 5%) | 1,878.75 | |
| උපචිත පොළිය | 40 | |
| උපචිත කුළිය | 100 | |
| වෙළඳ ගෙවිය යුතු මුදල් | 5,000 | 7,213.75 |
| **මුළු ස්කන්ධ සහ වගකීම්** | | **47,237.50** |

**(ලකුණු 13)**

**පෙර වැඩ - 01 විකුණුම් පිරිවැය**

| | |
|---|---|
| ආරම්භක තොගය - (3500 +1200) | 4,700 |
| මිලට ගැනුම් (8500+6000) | 14,500 |
| | 19,200 |
| අවසාන තොගය (2000+300) | (2,300) |
| | 16,900 |

**පෙර වැඩ - 02**

| | ඉඩම | ගොඩනැගිල්ල | මෝටර් රථ | කාර්යාල උපකරණ | එකතුව |
|---|---|---|---|---|---|
| 2018/04/01 දිනට | 9,000 | 6,000 | 6,000 | 1,000 | 22,000 |
| ඉවත්කිරීම් | | | (3,500) | | (3,500) |
| 2019/03/31 දිනට | 9,000 | 6,000 | 2,500 | 1,000 | 18,500 |
| ක්ෂය වීම් | | | | | |
| 2018/04/01 දිනට | - | 4,000 | 2,000 | 500 | 6,500 |
| ඉවත්කිරීම් | | | (1,400) | - | (1,400) |
| ක්ෂය | - | 600 | 512.5 | 100 | 1,212.5 |
| 2019/03/31 දිනට | - | 4,600 | 1,112.5 | 600 | 6,312.5 |
| ධාරණ අගය | | | | | 12,187.5 |

**පෙරවැඩ -03**

**මෝටර් රථ ඉවත් කිරීමේ ගිණුම**

| | | | |
|---|---|---|---|
| පිරිවැය | 3,500 | මුදල් | 2,800 |
| ලාභය | 700 | ක්ෂය | 1,400 |
| | 4,200 | | 4,200 |

ඉවත් කළ වත්කම් ක්ෂය – $3500 \times 10\% \times 4 = 1,400$

මෝටර් රථ ක්ෂය වීම් –

ඉවත් කළ මෝටර් රථයට – $3500 \times 10\% \times 9/12 = 262.5$

ඉතිරි මෝටර් රථ සඳහා – $2500 \times 10\% = 250$

512.5

**පෙරවැඩ් 04 බෙදා හැරීමේ වියදම්**

| | |
|---|---|
| විකුණුම් කොමිස් | 450 |
| වගකීම් සහතික | 1,878.75 |
| බොල් ණය | 160 |
| අඩමාන ණය වෙන් කිරීම | 40 |
| ප්‍රචාරණය | 375 |
| මෝටර් රථ ක්ෂය වීම් | 512.5 |
| | 3,416.25 |

**පෙර වැඩ - 05 පරිපාලන වියදම්**

| | |
|---|---|
| විදුලිය (250 + 45) | 295 |
| කුලිය | 600 |
| වැටුප් හා වේතන | 1,800 |
| දුරකතන ගාස්තු | 250 |
| ක්ෂයවීම් ගොඩනැගිලි | 600 |
| කාර්යාලීය උපකරණ | 100 |
| | 3,645 |

**(මුළු ලකුණු 25)**

***C කොටසේ අවසානය***